# <u>වැව්ලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය</u>

# ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය

## පුරප්පාඩු

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### *1. නේවාසික ඉංජිනේරු - පුරප්පාඩු 01*

- **සුදුසුකම්**

➢ **<u>බාහිර</u> :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් ඉංජිනේරු (සිවිල්/යාන්ත්‍රික) පිළිබඳ උපාධියක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලැබීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් තිබීම.

➢ **අභ්‍යන්තර :**

ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම

- **වයස** : අවුරුදු 22 ට වඩා අඩු නොවිය යුතු අතර අවුරුදු 45 ට වඩා වැඩි නොවිය යුතුය. මෙම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාල නොවේ.

- **සේවා කාණ්ඩය** : මධ්‍යම කළමනාකරණ (MM 1-2)

- **වැටුප් පරිමාණ** : රු. 94,170 – 10 x 2,480 – 15 x 3450 – Rs.170,720

- **අනෙකුත් ප්‍රතිලාභ** : ඉහත දක්වා ඇති වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

- **රැකියා විස්තරය** : ආයතනයේ යටිතල පහසුකම්, ආයතනික වාහන සමූහය, ගොඩනැගිලි හා රසායනාගාර සැලසුම් කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම, අභ්‍යන්තර මාර්ග ඇතුළු සියලුම සිවිල්, විදුලි හා යාන්ත්‍රික කටයුතු සම්බන්ධ සමස්ත සැලසුම්කරණය, අධීක්ෂණය, ඇස්තමේන්තු සකස් කිරීම, කළමනාකරණය සහ නඩත්තු කටයුතු සිදුකිරීම. අදාළ තාක්ෂණික කමිටුවල සේවය කිරීම සහ ගෙවීම් සහතික කිරීම.

- **තේරීමේ ක්‍රමය** : ලිඛිත තරඟ විභාගයක ප්‍රතිඵල මත (භාෂා නිපුණත්වය සහ අභියෝගතා පරීක්ෂණය) සහ/හෝ පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

Gazette.lk

**පොදු කොන්දේසි**

1. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.
2. අයදුම්කරු මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් පසුවිය යුතුයි
3. අයදුම්කරු දිවයින තුළ ඕනෑම ස්ථානයක සේවය කිරීමට කැමති විය යුතුයි.

**පොදු ප්‍රතිලාභ**

1. 1983 අංක 12 දරණ පාරිතෝෂික දීමනා පනත යටතේ හා 2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 අනුව පාරිතෝෂික ගෙවනු ලැබේ.
2. දායකත්ව වෛද්‍යාධාර යෝජනා ක්‍රමයට හිමිකම් ඇත.
3. අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල (අපේක්ෂකයන් විසින් වැටුපෙන් 10% ක් හා මණ්ඩලය විසින් 15% ක් අර්ථසාධක අරමුදල සඳහා සහ 3% ක් සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා ද දායක වනු ඇත.)
4. රබර් පර්යේෂණායතනයේ සේවකයින් හට ලැබෙන අනෙකුත් ප්‍රතිලාභ ද හිමිවනු ඇත.

**අයදුම්පත් ක්‍රියාවලිය**

අයදුම්කරුවන් විසින් උප්පැන්න සහතිකය සහ අනෙකුත් අදාළ සියළුම අධ්‍යාපන හා වෙනත් සහතිකපත්වල සහතික කරන ලද පිටපත් සහ චරිත සහතික දෙකක් (ඉන් එකක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය), ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක ද සමඟ අයදුම්කරුවන් විසින් අත්සන් කරන ලද තම අයදුම්පත 2026.10.30 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, රබර් පර්යේෂණ මණ්ඩලය, තෙලවල පාර, රත්මලාන යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ප්‍රමාදවී එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන නිලධාරීන් තම අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානින් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පතේ පිටපතක් සෘජුවම එවිය හැකි ය.

ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු ය.

අදාල සහතිකවල සහතික කරනලද පිටපත් නොමැතිව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කාරුණිකව සලකන්න.

මේ පිළිබඳව බලපෑම් කිරිම නුසුදුසුකමක් වනු ඇත.

සභාපති
රබර් පර්යේෂණ මණ්ඩලය
තෙලවල පාර
රත්මලාන.

2026.10.07

SINCE 2014
Gazette.lk
AMBITIONS REALIZED

SINCE 2014
Gazette.lk
AMBITIONS REALIZED